# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 37 දරන ඕලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 අගෝස්තු මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අගෝස්තු මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2011 අංක 37 දරන ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 අගෝස්තු මස 23 වන දින]

එල්. ඩී.— ඕ. (සංස්.) 13/2007.

### ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2011 අංක 37 දරන ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනමේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් "ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) බෞද්ධ ආගමික විශ්වාසයන් පිළිපදින්නන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා අවශ්‍ය වත්පිළිවෙත් හා සාරධර්ම ප්‍රවර්ධනය කිරීම හා පෝෂණය කිරීම ;

(ආ) බෞද්ධයන් මුහුණ දෙන මානසික හා චිත්තවේග පීඩාවන්ට බුදු දහම තුළින් ලබාගත හැකි සහනදායී ඉගැන්වීම ප්‍රගුණ කිරීමෙන් ඔවුන් තුළ පවතින අසහනකාරී තත්ත්වය අවම කොට සහනශීලී දිවි පෙවෙතකට යොමු කිරීම ;

(ඇ) බාල, තරුණ, මහලු කවර වයස් මට්ටමක අයකුට වුව ද බුදු දහම තුළින් ලබන ජීවිත පරිඥානය අවබෝධ කොට ගෙන මානව සමාජයේ පුළුල් නියෝජනයක් ඇතිවන ආකාරයට සහයෝගය හා සහජීවනය වර්ධනය කොට පටු වාද භේදවලින් බෞද්ධ ආගමික විශ්වාසයන් පිළිපදින්නන් මුදවා ගැනීම ;

(ඈ) ජාති, ආගම් භේදවලින් තොර වූ සදාචාරාත්මක සමාජයකට ඉවහල් වන සමාජ පෞද්ගලිකත්වය හඳුනාගෙන බෞද්ධ පවුල හා සමාජය ස්වයංපෝෂිත ඒකකයක් බවට පත් කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවේ ගම් දනව් කේන්ද්‍ර කොටගෙන ධර්ම ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උචිත, ත්‍රිපිටක ධර්මය පිළිබඳ මනා අවබෝධයක් ඇති භික්ෂු සමාජයක් ආරණ්‍ය සේනාසනය තුළින් ගොඩ නගාගෙන, මනා කැපවීම තුළින් උක්ත අරමුණ මල්ඵල ගැන්වීම ;

(ඊ) ශ්‍රී ලංකාවේ ගිහි පැවිදි උගතුන් සඳහා ත්‍රිපිටක ධර්මය ඇතුළත් පොත්පත් හා බොදු සාහිත්‍යය ඇතුළත් ධර්ම පර්යේෂණ ආයතන සංවර්ධනය කිරීම හා ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙමින් සමථ, විදර්ශනා භාවනා සඳහා පවතින ගල්ලෙන් සහිත ස්වාභාවික පරිසරය යොදා ගැනීමට ඔවුන් යොමු කිරීම ;

(ඇ) දරිද්‍රතාවයෙන් පෙළෙන බෞද්ධ දරුවන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා මූල්‍යමය හා භෞතික ප්‍රතිපාදන ලබා දෙමින් ඔවුන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා උපරිම දායකත්වය සැලසීම ;

(ඈ) කෘෂිකාර්මික හා ආර්ථික මූලෝපායයන් ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා අධ්‍යතන න්‍යායික හා ප්‍රායෝගික දැනුම්, අවශ්‍ය පිරිස් වෙත ලබා දීම ;

(එ) පාසල් අධ්‍යාපනය ලබන බෞද්ධ දරුවන්ගේ සාක්ෂරතාව වර්ධනය කරමින් ඔවුන් ඉදිරිපත් වන ප්‍රසිද්ධ විභාග සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ මඟ පෙන්වීම හා අමතර උදව් ලබා දීම සඳහා එකී දරුවන් යොමු කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) ස්වයං රැකියා ජීවනෝපායයන් සඳහා උනන්දුවක් දක්වන බෞද්ධ තරුණ තරුණියන්ට ඒ සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව භෞතික හා මූල්‍ය සම්පත් සපයා දෙමින් පවුල තුළ යහපත් ආර්ථික රටාවක් ගොඩ නැඟීමට ආධාර කිරීම;

(ඔ) ඉහත සංස්ථාවේ අරමුණු හා පරමාර්ථවලට සමාන අරමුණු හා පරමාර්ථ ඇති දේශීය හා විදේශීය වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා අවශ්‍ය වන විට සම්පත් හුවමාරු කර ගැනීම හා එම ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම ;

(ඕ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පොත් පත්, වාර සඟරා, අත් පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර, සඟරා මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍යතාව පරිදි බෙදා හැරීම ;

(ක) පරිපූර්ණ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කායික, මානසික, සමාජයීය, සදාචාර හා බුද්ධි සංවර්ධන කටයුතු උදෙසා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු හා සමූහ අධ්‍යයන කටයුතු සඳහා පූර්ණ අනුග්‍රහය දැක්වීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ග) ආරෝග්‍යශාලා ඇතුළු වෙනත් ගිලන්හල්වල රෝගීව සිටින පිරිස්වලට කායික, මානසික සහනය උදා කරමින් ඒ ඒ ආයතන වෙත ගොස් ඔවුන් සමඟ බෞද්ධ ආගමික වත්පිළිවෙත් සිදු කිරීම, ඔවුන් වෙනුවෙන් ඉටු කළ යුතු කවර හෝ සේවාවක් අවශ්‍ය වේ නම් ඒ සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම ;

(ච) ස්වාභාවික ආපදා ඇතුළු විවිධ ආපදාවන්ගෙන් පීඩාවට පත්වන බෞද්ධ ආගමික විශ්වාසයන් පිළිපදින්නන්ට ඔවුන්ගේ කායික හා මානසික ස්ථාවරත්වය සඳහා ක්ෂණික මැදිහත් වීම හා ඔවුන් යථා තත්ත්වයට පත් කිරීමට ගත යුතු කවර කාර්යයක දී වුව ද නොපමාව සක්‍රිය දායකත්වය සැපයීම ;

(ජ) මිනිසාගේ විභව ශක්තීන් හඳුනාගෙන එකී ශක්තීන් සමාජ හා පුද්ගල ප්‍රගමනයට යොදා ගැනීම පිළිබඳව අවධානය යොමු කරමින් වඩාත් ශක්තිමත්, අධිෂ්ඨානශීලී, ඉලක්ක සහගත ජන ජීවිතයකට අවශ්‍ය ආකල්ප හා නිපුණතා සංවර්ධනය කිරීමෙන් පුද්ගල ස්වීයත්වය ප්‍රවර්ධනය කිරීම ; සහ

(ට) මියගිය සෙබළුන්ගේ අනාථ වූ පවුල්වල බෞද්ධ ආගමික විශ්වාසයන් පිළිපදින්නන්ගේ අභිවෘද්ධිය උදෙසා ශුභසාධන කටයුතු සංවිධානය කිරීම හා ඔවුන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) ඔලගංගල මහා සුදර්ශන ආරණ්‍ය සේනාසනයෙහි නේවාසික විහාරාධිපති ස්වාමීන් වහන්සේ සහ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් තෝරාගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උපලේකම්, උපසභාපති සහ කාරක සභිකයන් සත්දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

දේපල අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම සහ ණය ගැනීම යනාදිය පිළිබඳව සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) පාලක මණ්ඩලයේ අනුමතය ඇතිව සංස්ථාවේ කාර්ය සඳහා රජයේ අනුමත (දේශීය හෝ විදේශීය) බැංකු හා ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට, සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට හා වැසීමට ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන යම් අරමුදලක් පාලක මණ්ඩලය සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) යම් නිශ්චල දේපලකට හෝ පෞද්ගලික දේපලකට බලපාන නීත්‍යානුකූල භාර සහ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ; සහ

(එ) සංස්ථාවේ කාර්ය සඳහා සේවක පිරිස් ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පුහුණු කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) පාලක මණ්ඩලය තෝරා පත් කර ගැනීම, පාලක මණ්ඩලයේ නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ පාලක මණ්ඩලයේ බලතල, කාර්ය සහ චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ පැවැත්ම ;

(ඈ) පාලක මණ්ඩලයේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යායපත්‍ර, රැස්වීම පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම ;

(ඉ) පාලක මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට පාලක මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කර සහතික කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**10.** සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වේ නම් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** සංස්ථාවේ ලේකම්, සභාපති සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.